**බස්නාහිර පළාතේ 2003 අංක 1 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි (සංශෝධිත) ප්‍රඥප්තිය**

1999 අංක 9 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ මෙයින් පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2003 අංක 1 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී (සංශෝධිත) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට එය ක්‍රියාත්මක වේ.

2. 1999 අංක 9 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ 2 (අ) වගන්තිය වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් 1999 අංක 9 දරණ ප්‍රඥප්තියේ 7 (2) (අ) වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

   7 (2) (අ) බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන ප්‍රධාන ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියකු